# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2080/23 – 2018 ජූලි 16 වැනි සඳුදා – 2018.07.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරනු ලදුව මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2018 අගෝස්තු මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

**එස්. ඒ. එන්. සරණතිස්ස,**
ලේකම්,
කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2018 ජූලි මස 10 වැනි දින,
කොළඹ 05.


1A – G 28101 – 202 (2018/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව වර්ෂ 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්ද වූ ද, සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්ද වූ තීරණවල II වන කොටස වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තව දුරටත් වෙනස් කළ යුතු ය.

*(අ).* ක්‍රියාකාරී සේවාවන් : ආරක්ෂක නිලධාරීන්, ආරක්ෂක භටයින්, මුරකරුවන්, පැට්රෝල්මන් හෝ කිනම් නමින් හැඳින්වුව ද ක්‍රියාකාරී සේවාවන් හි යෙදෙන සේවකයින්.

*(ආ).* පාලනමය සේවාවන් : ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්යභාර නිලධාරීන්, මුර සේවා භාර සුපවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

ඉහතින් දක්වා ඇති සේවකයින්ට ගෙවිය යුතු කාල මිම්මේ මාසික අවම වේතන මෙසේ ය.

### අවම මාසික වේතනය

| සේවා වසර | ක්‍රියාකාරී සේවාවන් රු. ශත | පාලනමය සේවාවන් රු. ශත |
|---|---|---|
| 1 වන වසර | 10,000.00 | 10.620.00 |
| 2 වන වසර | 10,100.00 | 10,770.00 |
| 3 වන වසර | 10,200.00 | 10,920.00 |
| 4 වන වසර | 10,300.00 | 11,070.00 |
| 5 වන වසර | 10,400.00 | 11,220.00 |
| 6 වන වසර | 10,500.00 | 11,370.00 |
| 7 වන වසර | 10,600.00 | 11,520.00 |
| 8 වන වසර | 10,700.00 | 11,670.00 |
| 9 වන වසර | 10,800.00 | 11,820.00 |
| 10 වන වසර | 10,900.00 | 11,970.00 |
| 11 වන වසර | 11,000.00 | 12,120.00 |
| 12 වන වසර | 11,100.00 | 12,270.00 |
| 13 වන වසර | 11,200.00 | 12,420.00 |
| 14 වන වසර | 11,300.00 | 12,570.00 |
| 15 වන වසර | 11,400.00 | 12,720.00 |
| 16 වන වසර | 11,500.00 | 12,870.00 |
| 17 වන වසර | 11,600.00 | 13,020.00 |
| 18 වන වසර | 11,700.00 | 13,170.00 |
| 19 වන වසර | 11,800.00 | 13,320.00 |
| 20 වන වසර | 11,900.00 | 13,470.00 |
| 21 වන වසර | 12,000.00 | 13,620.00 |
| 22 වන වසර | 12,100.00 | 13,770.00 |
| 23 වන වසර | 12,200.00 | 13,920.00 |
| 24 වන වසර | 12,300.00 | 14,070.00 |
| 25 වන වසර | 12,400.00 | 14,220.00 |
| 26 වන වසර | 12,500.00 | 14,370.00 |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.